# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1644 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 30/12/2023<br>පැය 1545 |

**මාධ්‍ය නිවේදනය**

**පාසැල් අවට සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් ඒ අවට වෙළඳසැල් හිමියන් හා සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම- ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

පරිසර ආරක්ෂණ සහ ප්‍රජා පොලිස් දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති විසින් මත්ද්‍රව්‍ය භාවිතයන් සිදු වන බවට හඳුනාගෙන ඇති පොලිස් වසම් වල පාසල් අවට මීටර් 500 ක් පමණ දුර ප්‍රමාණයේ පිහිටා ඇති පාසල් වල දරුවන් එදිනෙදා අවශ්‍යතා සඳහා යොමුවන පොත්හල් අනෙකුත් වෙළඳසැල් , ආහාර මිළදී ගැනීමට ඇති ස්ථාන වල, කොන්ඩා කපන ස්ථාන වල හිමිකරුවන් හා සේවකයින් කැඳවා දැනුවත් කිරීමේ වැඩසටහන් 2023.12.18 වන දින සිට 2023.12.24 වන දින දක්වා සිදුකරන ලෙස දිවයිනේ සියළුම පොලිස් කොට්ඨාසවල ප්‍රධානීන් වෙත දැනුම් දී තිබිණි.

ඒ අනුව පොලිස් කොට්ඨාස 45 තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 2935 ක් ආවරණය වන පරිදි පිහිටා ඇති පාසල් 3183 ක මීටර් 500 ක පමණ දුර ප්‍රමාණයක් ආවරණය වන පරිදි පිහිටා ඇති පොත්හල් හා අනෙකුත් වෙළඳසැල්, ආහාර මිළදී ගැනීමට ඇති ස්ථාන, සැලුන් වල හිමිකරුවන් හා සේවකයින් 35000ක පමණ පිරිසක් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

එහිදී මත්ද්‍රව්‍ය භාවිතා කරනු ලබන සහ ජාවාරම් සිදුකරනු ලැබූ සැකකරුවන් 217 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර සෝදිසි කිරීම මඟින් හෙරොයින් ග්‍රෑම් 95ක් , ගංජා ග්‍රෑම් 7130, නිති විරෝධී දුම්වැටි 85ක්, මත් පෙති 16561ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 48ක් හා මාවා කිලෝ 113 කට අධික ප්‍රමාණයක් සොයාගෙන ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**